# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.08.12

චක්‍රලේඛ අංකය : MOF/DFD/2026/01

ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

**2026 යල කන්නයේ වී අස්වනු මිලදී ගැනීමේ කඩිනම් වැඩපිළිවෙළ**

2026 යල කන්නය සඳහා රජයේ සහතික මිල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ සමුපකාර සමිති හරහා ප්‍රමිතියෙන් යුතු වී තොග මිලදී ගැනීමට රජය තීරණය කර ඇත. මෙමගින්, රජයේ වී මිලදී ගැනීමේ ප්‍රතිපත්තිය ප්‍රකාරව මෙම කන්නයේ වී මිලදී ගැනීමේ කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අතිගරු ජනාධිපතිතුමා සහ අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් දී ඇත. මෙම වැඩසටහන කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ සහය ඇතිව දිස්ත්‍රික් ලේකම්වරුන් හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ඇත.

2. මෙම වී මිලදී ගැනීමේ වැඩසටහන තුළ වී මෝල් හිමියන් තෝරා ගැනීම, එම තෝරා ගත් වී මෝල් හිමියන්ට අවශ්‍ය අරමුදල් ලබා දීම, ඊට අදාළ ලේඛන පවත්වා ගැනීම හා ගිණුම්ගත කිරීම, එම වී තොග බැහැර කිරීම අධීක්ෂණය කිරීම හා ලබා දුන් මුදල් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ගෙන් හා සමුපකාර සමිතිවලින් නැවත අයකරගෙන භාණ්ඩාගාරය වෙත පියවීමේ වගකීම අදාළ දිස්ත්‍රික් ලේකම්වරු වෙත පැවරේ. අදාළ නිලධාරීන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පහත දක්වා ඇති උපදෙස් අනුගමනය කළ යුතුය.

3. 2026 යල කන්නයේ වී මිලදී ගැනීමේ සහතික මිල

වී මිලදී ගන්නා ස්ථාන වෙත රැගෙන එන වී තොගවල උපරිම තෙතමනය 14% ක් සහ උපරිම බොල් වී ප්‍රමාණය 9%ක් වන නිසි ප්‍රමිතියෙන් යුතු වී කිලෝ ග්‍රෑමයක්, පහත සඳහන් රජයේ සහතික මිලට ලියාපදිංචි වූ අදාළ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හා සමුපකාර සමිති විසින් මිලදී ගත යුතුය.

| වර්ගය | රජයේ සහතික මිල (කිලෝ ග්‍රෑම් 01ක් රුපියල්) (තෙතමනය 14% ට අඩු) |
|---|---|
| නාඩු - සුදු | 120 |
| නාඩු - රතු | 120 |
| සම්බා | 130 |

4. ඉහත සඳහන් සහතික මිල ගණන්වලට යටත්ව පහත සඳහන් කොන්දේසි අනුව මෙම වී මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය.

4.1 අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් තෝරාගත් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ සමූපකාර සමිති හරහා ප්‍රමිතියෙන් යුතු වී කිලෝ ග්‍රෑම් එකක් ඉහත සඳහන් රජයේ සහතික මිලට මිලදී ගැනීම. එසේ මිලදී ගැනීමේ කටයුතු නීත්‍යානුකූලව සිදු කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද මේ සමඟ අමුණා ඇති ආකෘතිය (ඇමුණුම 01) අනුව දෙපාර්ශවය විධිමත් ගිවිසුමකට එළඹිය යුතුය.

4.2 මෙම වී මිලදී ගැනීමේ වැඩසටහන සඳහා සුදුසුකම් ලැබීමට සුළු හා මධ්‍ය පරිමාණ වී මොල් හිමියන් සහ සමූපකාර සමිති පහත අවශ්‍යතා සපුරාලිය යුතුය.

4.2.1 වී මෙට්‍රික් ටොන් 25ක් උපරිම දෛනික කෙටුම් ධාරිතාවක් සහිත වී මෝල් හිමියන් සහ එම ධාරිතාවයෙන් යුතු වී මෝලක් හිමි සමූපකාර සමිති.

4.2.2 මෙම වැඩසටහනට සම්බන්ධවීමට අපේක්ෂිත වී මෝල් හිමියන් හා සමූපකාර සමිති ව්‍යාපාර ආයතනයක් වශයෙන් ලියාපදිංචි වී තිබිය යුතුය. (උදා: තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර සහ සමාගම් පනත යටතේ සමාගමක් වශයෙන් හෝ සමූපකාර පනත යටතේ සමූපකාර සමිතියක් ලෙස).

4.2.3 එසේම, මෙම වැඩසටහනට සම්බන්ධවීමට අපේක්ෂිත වී මෝල් හිමියන් සහ සමූපකාර සමිති වී මෝල් පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ද ලියාපදිංචි විය යුතුය.

4.3 මූල්‍ය පහසුකම සැපයීමට අදාළ කොන්දේසි

4.3.1 එක් වී මෝල් හිමියෙකුට හෝ සමූපකාර සමිතියකට මෙම වැඩසටහන යටතේ ලබාදෙන උපරිම මුදල රුපියල් මිලියන 25කි.

4.3.2 අනුමත මුදලින් 25%ක් මූලික මුදලක් (අත්තිකාරම්) ලෙස සුදුසුකම්ලත් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට හෝ සමූපකාර සමිතියට අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් ලබා දිය යුතු අතර ඉතිරි මුදල සමාන වාරික තුනකින් (03) නිදහස් කළ යුතුය. එම එක් එක් වාරිකයක් නිදහස් කිරීමට පෙර ඊට ප්‍රථම ලබාදුන් වාරික මුදලට ප්‍රමාණවත් වී තොග මිලදීගෙන ඇති බව තහවුරු කර ගත යුතුය.

4.3.3 සුදුසුකම්ලත් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට හෝ සමූපකාර සමිතිවලට ලබා දුන් මුදලට සරිලන වී ප්‍රමාණයක් අනිවාර්යයෙන්ම මිලදී ගත යුතු අතර එසේ නොමැතිව මුදල් ඉතිරි වුවහොත් නොපමාව එම මුදල අදාළ දිස්ත්‍රික් ලේකම් විසින් ආපසු ලබා ගත යුතුය.

4.3.4 මෙම මූල්‍ය පහසුකම් ලබා ගන්නා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හා සමූපකාර සමිති විසින් එම වී තොග සහල් බවට පත් කර වෙළඳපොළ මිලට අලෙවි කිරීමෙන් පසු ලබාගත් අරමුදල් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත එකවර හෝ වාරික වශයෙන් ගෙවිය යුතුය.

4.3.5 දිස්ත්‍රික් ලේකම් විසින් අදාළ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්ගෙන් හෝ සමූපකාර සමිතිවලින් පොරොන්දු නෝට්ටු ආකෘතියට අනුව ලබා දෙන මුළු මුදල සඳහා පොරොන්දු නෝට්ටුවක් ලබා ගත යුතුය.

4.3.6 අරමුදල් ලබාගන්නා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හා සමුපකාර සමිති එම අරමුදල් ලබාගන්නා දින සිට උපරිම වශයෙන් දින 240ක කාල පරිච්ඡේදයක් තුළ ලබාගත් මුළු මුදල නැවත අදාළ දිස්ත්‍රික් ලේකම් වෙත පියවිය යුතු අතර ඒ සඳහා කිසිදු පොලියක්, කොමිස් මුදලක් හෝ වෙනත් ගාස්තුවක් අදාළ දිස්ත්‍රික් ලේකම් විසින් අය නොකළ යුතුය.

4.3.7 ලබාගත් මුදල දින 240ක කාල සීමාව තුළ පියවීමට අපොහොසත් වුවහොත් ගෙවිය යුතු හිඟ මුදල සඳහා එම ප්‍රමාද කාලයට අදාළව 10% වාර්ෂික ප්‍රමාද ගාස්තුවක් සමඟ ගෙවිය යුතු මුළු මුදල අයකරගත යුතුය. ප්‍රමාද වන දින ගණන අනුව මෙම ප්‍රමාද ගාස්තුව ගණනය කළ යුතුය.

5. මෙම වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය

5.1 වගා කර ඇති බිම් ප්‍රමාණය අනුව එක් ගොවියකුගෙන් මිලදී ගත හැකි වී ප්‍රමාණය පහත පරිදි වේ.

| වගා කරන බිම් ප්‍රමාණය | මිලදීගත හැකි උපරිම වී ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) |
|---|---|
| අක්කර 1 දක්වා | 1,000 |
| අක්කර 1ට වැඩි – 3 දක්වා | 2,500 |
| අක්කර 3ට වැඩි – 5 දක්වා | 4,000 |

5.2 අදාළ ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර විසින් අදාළ වී ගොවියා වගාකර ඇති බිම් ප්‍රමාණය තහවුරු කර රජයේ සහතික මිලට මෙම වැඩසටහන යටතේ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියකුට හෝ සමුපකාර සමිතියකට විකිණිය හැකි උපරිම වී කිලෝ ප්‍රමාණය ඉහත වගුවේ දක්වා ඇති සීමාවන් අනුව තහවුරු කර නිර්දේශ ලිපියක් (ඇමුණුම 02) අදාළ ගොවියා වෙත ලබා දිය යුතුය.

5.3 මෙම වැඩසටහන යටතේ තම වී අස්වැන්න අලෙවි කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දෙන අවස්ථාවේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර විසින් ස්වයං ප්‍රකාශය (Self Declaration) අදාළ ගොවියාගෙන් ලබාගත යුතුය (ඇමුණුම 03).

5.4 එම නිර්දේශ ලිපිය ලබා ගත් ගොවියකුට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රසිද්ධ කරන ලද මෙම වැඩසටහනට ලියාපදිංචි වූ ඕනෑම සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියකුට හෝ සමූපකාර සමිතියකට එම නිර්දේශ ලිපියේ සඳහන් වී ප්‍රමාණය අලෙවි කළ හැකිය.

5.5 වී මිලදී ගැනීමේදී වී ගොවීන්ගෙන් ලබාගත් නිර්දේශ ලිපි සහිත ලිපි ගොනුවක් හා වී මිලදී ගත් ගොවීන්ගේ නාම ලේඛනයක් අදාළ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හෝ සමූපකාර සමිති විසින් පවත්වා ගන යා යුතුය.

5.6 ගොවීන්ගෙන් වී මිලදී ගන්නා විට ඉහත සඳහන් රජයේ සහතික මිලට වී මිලදී ගත් බව තහවුරු කිරීම සඳහා වවුචර් පතක් නිකුත් කළ යුතු අතර එහි පිටපත් ඇතුළත් ලිපිගොනුවක් අදාළ වී මෝල් හිමියන් හෝ සමූපකාර සමිති විසින් පවත්වගෙන යා යුතුය. මිලදී ගත් වී තොගය හා වී මිලදී ගත්

ගොවීන්ගේ නම් ඇතුලත් වාර්තාවක් සෑම සතියක් අවසානයේදීම අදාළ ප්‍රාදේශීය ලේකම්ට පිටපතක් සහිතව දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කළ යුතුය.

5.7 වී මිලදී ගැනීමේ වැඩසටහන අධීක්ෂණය කිරීම සඳහා අදාළ ලිපි ගොනු හා ලියවිලි දිස්ත්‍රික් ලේකම්වරයාට හෝ බලය පැවරූ ඔහුගේ නියෝජිතයකුට, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් හෝ බලය පැවරූ ඔහුගේ නියෝජිතයකුට ඕනෑම අවස්ථාවකදී පරීක්ෂා කිරීමට බලය හිමි වේ. ඒ සඳහා අවශ්‍ය සියලු ලේඛන ඕනෑම අවස්ථාවක අදාළ නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමට සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හෝ සමූපකාර සමිති බැඳී සිටිය යුතුය.

5.8 2019/20 මහ කන්නයේ සිට 2022/23 මහ කන්නය දක්වා දිස්ත්‍රික් ලේකම්වරු හරහා ක්‍රියාත්මක කළ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ මූල්‍ය පහසුකම් ලබාගෙන මෙතෙක් එම මුදල් ගෙවීම පැහැර හැර ඇති සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් මෙම වැඩසටහන සඳහා ඇතුළත් නොකළ යුතුය.

5.9 මෙම වැඩසටහන යටතේ ලබා දෙන අරමුදල් අදාළ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හෝ සමූපකාර සමිති වෙත ගෙවීමට ඇති හෝ මහා භාණ්ඩාගාරය විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ගෙවීමට ඇති කිසියම් මුදලකට හිලව් නොකළ යුතුය.

5.10 මෙම වැඩසටහන ඉදිරි කන්නවලදී ද වී ගොවියා සඳහා සාධාරණ මිලක් ලබා දීම, ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට තම ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා සහය වීම යන අරමුණු ඇතිව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බැවින් මෙම කන්නයේ ලබා ගන්නා මුදල් නියමිත පරිදි නැවත ගෙවන සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් පමණක් ඉදිරි කන්නවලදී මෙම වැඩසටහන සඳහා ඇතුළත් කළ යුතුය.

6. ප්‍රතිපාදන, අත්මුදල් ලබාදීම සහ නැවත පියවීම.

6.1 ආරක්ෂිත වී තොගයක් පවත්වා ගැනීම සඳහා වී තොග මිලදී ගැනීමේ වැඩසටහන වෙනුවෙන් කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය විෂය විස්තර අංක 118-2-03-94-2509 යටතේ සලසා දී ඇති මූල්‍ය ප්‍රතිපාදන, මුදල් රෙගුලාසි 208 විධිවිධාන අනුව අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත වෙන් කරදීමට කටයුතු කල යුතුය.

6.2 සිය දිස්ත්‍රික්ක වල වී මිලදී ගැනීමේ සැලැස්මට අනුව අවශ්‍ය වන ප්‍රතිපාදන අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලුම් කල යුතු අතර, ඒ සඳහා වන අත්මුදල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාළ දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂය වෙත සෘජුවම නිකුත් කිරීමට කටයුතු කල යුතුය.

6.3 මේ වැඩසටහන යටතේ නැවත අය වෙන මුදල දිස්ත්‍රික් ලේකම් විසින් ආදායම් ශීර්ෂ අංක 20.03.07.00 යටතේ ඒකාබද්ධ අරමුදලට නොපමාව බැර කල යුතුය. එසේ අදාල ආදායම් ශීර්ෂයට බැර කරන ලද මුදල අග්‍රිම පියවීමක් ලෙස සටහන් කර කඩිනමින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට බැර කළ යුතුය.

6.4 මේ සම්බන්ධයෙන් හුවමාරු වන ලිපි මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ද පිටපතක් සහිතව යොමු කළ යුතුය.

7. වී මිලදී ගැනීමේ වැඩසටහන අධීක්ෂණය කිරීම.

7.1 ජනාධිපති කාර්යාලය සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම වැඩසටහන අධීක්ෂණය කරනු ලබන අතර එහි ප්‍රගතිය සතිපතා ඉදිරිපත්කළ යුතුය.

7.2 මෙම වැඩසටහන යටතේ අරමුදල් ලබා ගත් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හා සමූපකාර සමිති විසින් රජයේ සහතික මිලට වී මිලදී ගන්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා ගොවිජනසේවා කොමසාරිස් ජනරාල්වරයා වෙත බලය පැවරෙන අතර ප්‍රාදේශීය මට්ටමින් එම කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අදාළ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් මට්ටමින් කමිටු පිහිටුවීම හරහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

7.4 මෙම වැඩසටහන යටතේ මිලදී ගන්නා වී තොග රැස් කර ඇති ගබඩා පරිශ්‍ර සඳහා අවශ්‍ය ආරක්ෂාව අදාළ දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිර්දේශය මත අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයා විසින් ලබා දිය යුතුය.

7.5 වී අලෙවි මණ්ඩලය හරහා ක්‍රියාත්මක කරනු ලබන රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ 2026 යල කන්නය සඳහා රජයේ සහතික මිලට වී අලෙවි මණ්ඩලය වෙත තම වී අස්වැන්න මේ වන විටත් අලෙවි කර ඇති ගොවීන්ට මෙම වැඩසටහන යටතේ විකිණිය හැක්කේ ඉහත 5.1හි සඳහන් වී තොග ප්‍රමාණයෙන් වී අලෙවි මණ්ඩලයට විකුණන ලද ප්‍රමාණය අඩු කර ඉතිරි වී ප්‍රමාණය පමණි.

8. මෙම වැඩසටහන යටතේ සහනදායී මූල්‍ය පහසුකම් ගත් පාර්ශවයන් විසින් ලබා ගත් මුදල ඉහත අංක 4.3.6හි දක්වා ඇති පරිදි ගෙවීම පැහැර හරින්නේනම් ශ්‍රී ලංකාවේ බල පවත්නා නීති යටතේ අදාළ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

9. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ජාතික ප්‍රමුඛතාවයක් සේ සලකා සමස්ත රාජ්‍ය සේවයම අස්වනු නෙළන කාලය තුළ කැපවීමෙන් ආදර්ශමත්ව කටයුතු කළ යුතු බව අතිගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් ලබාදී ඇත. මෙම කටයුතු සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩිමනත් උපදෙස් අවශ්‍ය වන්නේනම් ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය, ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් (සංවර්ධන පරිපාලන) ජනාධිපති කාර්යාලය, අධ්‍යක්ෂ ජනරාල් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව හෝ කොමසාරිස් ජනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ඇමතිය හැකිය.

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

| | | | |
|---|---|---|---|
| 1 | ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය | - | කරු.දැ.ග.ස. |
| 2 | විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය | - | කරු.දැ.ග.ස. |
| 3 | පොලිස්පති, ශ්‍රී ලංකා පොලීසිය | - | කරු.දැ.ග.ස |
| 4 | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | - | කරු.දැ.ග.ස. |
| 5 | අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | - | කරු.දැ.ග.ස. |
| 6 | අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | - | කරු.දැ.ග.ස. |
| 7 | කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | - | කරු.දැ.ග.ස. |

ඇමුණුම 01

# 2026 යල කන්නයේ වී මිලදී ගැනීමේ ගිවිසුම් පත්‍රයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ................................ පරිපාලන දිස්ත්‍රික්කයේ ........................................................................... දරන ලිපිනයෙහි ප්‍රධාන කාර්යාලය ලෙස පවතින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම් ....................................................(නම) හෝ ඔහුගේ නිල අනුප්‍රාප්තිකයෝ ද ඇතුළත් වන පළමු පාර්ශවයද .............................. පරිපාලන දිස්ත්‍රික්කයේ ................................................................... ලිපිනයෙහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන ..................................................................................................................(සහල් මෝලේ නම), .......................................................................................(සහල් මෝලේ හිමිකරුගේ නම) .....................................................(ජා.හැ.අංකය) හෝ එකී මෝල් හිමිකරුට අයත් උරුමක්කරුවෝද, අද්මිනිස්ත්‍රාතිකාරයෝ ද, නිල අනුප්‍රාප්තිකයෝ ද ඇතුළත් වන දෙවන පාර්ශවය ද 2026 යල කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ වී මිලදී ගැනීම සම්බන්ධයෙන් මතු දැක්වෙන වගන්ති ප්‍රකාර කටයුතු කිරීමට ගිවිසගෙන පහත අත්සන් තබා ඇතිකර ගන්නා වූ ගිවිසුමයි.

01. පළමු පාර්ශවය විසින් 2026 යල කන්නයට අදාළව රජයේ සහතික මිල යටතේ ගොවීන්ගෙන් වී මිලදී ගැනීම සඳහා දෙවන පාර්ශවය වෙත රුපියල් මිලියන 25ක උපරිමයකට යටත්ව පොලී රහිත සහනදායී මූල්‍ය පහසුකමක් ලබා දීමට එකඟවේ.

02. ඒ අනුව, මෙම වැඩසටහන යටතේ දෙවන පාර්ශවය විසින් පහත දැක්වෙන රජයේ සහතික මිලට ගොවීන්ගෙන් වී මිලදී ගැනීමට එකඟවේ.

| වර්ගය | රජයේ සහතික මිල (කිලෝග්‍රෑම් එකක් රුපියල්) (තෙතමනය 14%ට අඩු) |
|---|---|
| නාඩු - සුදු | 120 |
| නාඩු - රතු | 120 |
| සම්බා | 130 |

03. ආරම්භක අවස්ථාවේ පළමු වාරිකය ලෙස සහනදායී මූල්‍ය පහසුකමින් සියයට 25ක් පළමු පාර්ශවය විසින් ලබා දිය යුතු අතර සමස්ත මූල්‍ය පහසුකම උපරිම වාරික 04 කින් දෙවන පාර්ශවය වෙත ලබා දීමට එකඟ වේ.

04. පළමු වාරිකය ලබා ගත් දින සිට දින 60ක් ඇතුළත වාරික 04 ම ලබාගත යුතුය. එම කාලසීමාවෙන් පසුව වාරික නිදහස් කිරීමක් පළමු පාර්ශවය විසින් සිදු කරනු නොලැබේ. මෙම වැඩසටහන යටතේ ලබා ගන්නා මූල්‍ය පහසුකමෙහි පළමු වාරිකය නිදහස් කළ දින සිට දින 240ක් ඇතුළත දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ලබාගත් පොලී රහිත සහනදායී මූල්‍ය පහසුකම සම්පූර්ණයෙන්ම ආපසු ගෙවා නිම කිරීමට එකඟ වේ.

05. ඉහත 04 හි දක්වා ඇති ආපසු ගෙවීමේ කාලසීමාව තුළ මූල්‍ය පහසුකම ආපසු ගෙවා නිම කිරීමට අපොහොසත් වුවහොත් එම ප්‍රමාද කාලය සඳහා සියයට 10ක වාර්ෂික ප්‍රමාද ගාස්තුවක් ප්‍රමාද වන දින ගණන අනුව ගෙවීමට දෙවන පාර්ශවය එකඟවේ.

06. අදාළ ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර මෙම වැඩසටහන යටතේ වී අලෙවි කරන ගොවීන් වී වගා කර ඇති බිම් ප්‍රමාණය පිළිබඳව නිකුත් කරන ලද නිර්දේශ ලිපියේ පිටපතක් දෙවන පාර්ශවය විසින් ලබාගත යුතුය.

07. දෙවන පාර්ශවය විසින් ගොවීන්ගෙන් වී මිලදී ගන්නා විට රජයේ සහතික මිලට ගොවීන්ගෙන් වී මිලදී ගත් බව තහවුරු කිරීම සඳහා වවුචර් පතක් නිකුත් කළ යුතු අතර එහි පිටපත් ඇතුළත් ලිපිගොනුවක් දෙවන පාර්ශවය විසින් පවත්වගෙන යාමට එකඟවේ. එම ලිපි ගොනු හා ලියවිලි පළමු පාර්ශවය හෝ බලය පැවරූ ඔහුගේ නියෝජිතයකුට ඕනෑම අවස්ථාවකදී පරීක්ෂා කර බලා වී මිලදී ගැනීමේ වැඩසටහන අධීක්ෂණය කිරීම සඳහා ලබා දීමට දෙවන පාර්ශවය එකඟවේ.

08. මෙම වැඩසටහන යටතේ මිලදී ගන්නා ලබන වී තොගය අධීක්ෂණය පහසුව පිණිස වෙන් වශයෙන් ගබඩා කිරීමටත් සහල් වෙළඳපලට නිකුත් කරන අවස්ථාවේ දී පළමු පාර්ශවය හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයකු දැනුවත් කිරීමටත් දෙවන පාර්ශවය එකඟවේ.

09. මේ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක MOF/DFD/2026/01 දරන චක්‍රලේඛයේ අංක 5.1 අනුව දක්වා ඇති උපරිම වී ප්‍රමාණයට යටත්ව ගොවීන්ගෙන් වී මිලදී ගැනීමට දෙවන පාර්ශවය එකඟ වේ.

10. මිලදී ගනු ලබන වී තොගය නිසියාකාරව ගබඩා කිරීම සහ පවත්වාගෙන යාම දෙවන පාර්ශවය සතු වගකීමක් වේ. එහිදී සිදුවනු ලබන භෞතික හෝ වෙනත් කිසිදු හානියක් සම්බන්ධයෙන් පළමු පාර්ශවයේ නෛතික බැඳීමක් නොමැත.

11. මෙම ගිවිසුම යටතේ ලබාදෙනු ලබන සෑම මුදල් වාරිකයක් වෙනුවෙන්ම දෙවන පාර්ශවය විසින් එකී වාරිකයේ වටිනාකමට සමාන අගයක් සහිත පොරොන්දු නෝට්ටුවක්, පළමු පාර්ශවයේ වාසියට නිකුත් කළ යුතුය.

12. යම් හෙයකින් මෙම ගිවිසුම් ප්‍රකාරව ලබාගත් මුදල, මෙම ගිවිසුමේ සඳහන් පරිදි ආපසු ගෙවීම දෙවන පාර්ශවය විසින් පැහැරහරිනු ලැබුව හොත්, ඉහත කී පොරොන්දු නෝට්ටුව මත ලඝුකාර්ය පටිපාටිය යටතේ නඩු පවරා එය අයකර ගැනීමට පළමු පාර්ශවයට හිමිකම් ඇත. එවැනි අවස්ථාවකදී ලඝුකාර්ය පටිපාටිය යටතේ නඩු පැවරීම සම්බන්ධයෙන් විරෝධතා නොගැනීමට දෙවන පාර්ශ්වය පොරොන්දු වේ.

13. දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවයෙන් ලබා ගන්නා පොලී රහිත සහනදායී මූල්‍ය පහසුකම සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් වන තෙක් මෙම ගිවිසුම වලංගු වේ.

මෙම ගිවිසුම පාර්ශවකරුවන් විසින් ඉහත සඳහන් ප්‍රකාර ගිවිස ගැනීමට ස්වකීය අත්සන තබන්නට යෙදුනා ඇත.

වර්ෂ .............................. ක් වූ ................... මස ................. වන දින .................................... පළමු පාර්ශවයේ කාර්යාලයේදී අත්සන් කරන ලදි.

........................................ ........................................

පළමු පාර්ශවය (දිස්ත්‍රික් ලේකම් හෝ නියෝජිත) දෙවන පාර්ශවය (සහල් මෝල් හිමිකරු)

....................... දිස්ත්‍රික්කය ....................................(ලිපිනය)

සාක්ෂිකරුවන්

1. ...........................................

2. ...........................................

| |
|---|
| මුද්දරය<br>රු. 100/= |

ඇමුණුම 02

# 2026 යල කන්නයේ වී විකිණීම

## කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරගේ නිර්දේශය

වෙත : ………………………….. ( වී මිලදී ගනු ලබන මෝල් හිමියාගේ හෝ සමූපකාර සමිතියේ නම)

දිනය : ……………………………………………

ගොවියාගේ නම : ……………………………...

ජා. හැ. අංකය : ……………………………………

ලිපිනය : ……………………………………………

**2026 යල කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ වී තොග විකිණීමේ වාර්තාව**

| අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | 2026 යල කන්නයට අදාලව වගා කර ඇති බිම් ප්‍රමාණය (අක්කර) | |
| 2 | චක්‍රලේඛයේ 5.1 අනුව විකිණීමට නිර්දේශ කරන උපරිම වී ප්‍රමාණය (කිලෝග්‍රෑම්) | |
| 3 | 2026 යල කන්නයට අදාලව දැනට වී අලෙවි මණ්ඩලයට විකුණා ඇති වී ප්‍රමාණය (කිලෝග්‍රෑම්) | |
| 4 | රජයේ වී මිලදී ගැනීමේ මෙම වැඩසටහන යටතේ විකිණීමට නිර්දේශ කරන වී ප්‍රමාණය (කිලෝග්‍රෑම්) ( 2 - 3 ) | |

ඉහත නම් සඳහන් ……………………………………………………… (ගොවියාගේ නම) සතුව ඇති වී කිලෝග්‍රෑම් ……………………………………………………………(ඉහත වගුවේ අංක 4 අනුව) ප්‍රමාණයක් ………………………………………………… ( වී මිලදී ගනු ලබන මෝල් හිමියාගේ හෝ සමූපකාර සමිතියේ නම) වෙත විකිණීම නිර්දේශ කරමි.

……………………………………

කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර

(නම හා අත්සන)

ඇමුණුම 03

# ස්වයං ප්‍රකාශය

## 2026 යල කන්නයේ වී විකිණීම

වෙත : දිස්ත්‍රික් ලේකම් ...............................

දිනය : ................................................

ගොවියාගේ නම : ..................................

ජා. හැ. අංකය :......................................

ලිපිනය : ...............................................

**විෂයය : 2026 යල කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ වී තොග විකිණීම**

මම/අපි, පහත අත්සන් කරනු ලබන තැනැත්තා/තැනැත්තන් වන අතර, 2026 යල කන්නයෙහි වී විකිණීමට අදාළව පහත සඳහන් කරුණු මෙයින් ප්‍රකාශ කර තහවුරු කරමි/කරමු.

1. මම/අපි 2026 යල කන්නය සඳහා රජය විසින් වී අලෙවි මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ මාගේ/අපගේ වී තොග රජයේ සහතික මිලට විකුණා නොමැති බව මෙයින් තහවුරු කරමි/කරමු.

2. මම/අපි 2026 යල කන්නය සඳහා රජය විසින් වී අලෙවි මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ මාගේ/අපගේ වී කිලෝග්‍රෑම් .................. ප්‍රමාණයක් රජයේ සහතික මිලට විකුණා ඇති බව මෙයින් තහවුරු කරමි/කරමු.

(ඉහත අදාළ නොවන ඡේදය කපා හරින්න)

ඉහත සඳහන් කර ඇති සියලු තොරතුරු මාගේ/අපගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි/කරමු.

අත්සන : ....................................

නම : .....................................

දිනය : .....................................